**සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම - 2015**

-----------------------------------------------------------------

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. එම විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.
එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය**

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 මාර්තු 31 දිනට සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ සම්බන්ධව ගිණුම් තැබීමේදී වර්තමාන සේවා පිරිවැය, පොළී පිරිවැය සහ ආයුගණක ලාභ සහ අලාභ හඳුනාගෙන ප්‍රක්ෂිප්ත ඒකක ප්‍රතිලාභ ක්‍රමය අනුව ගණනය කර දක්වා නොතිබුණි.

**2.2.2 නොසැසඳීම්**

2015 මාර්තු 31 දිනට හුනුපිටිය ප්‍රධාන ගබඩාවේ තොග පොත් අනුව පොහොර තොගය මෙට්‍රික් ටොන් 23,911.22 වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව එය මෙට්‍රික් ටොන් 23,522.95 වුයෙන් මෙට්‍රික් ටොන් 388.27 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 මාර්තු 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.56,957,862 ක් වූ අතර එහි ඇතුළත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 45 කින් අයවිය යුතු ණය ශේෂය රු. 11,791,091 ක් විය. එම මුදලින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 24 කින් අයවිය යුතුව තිබූ රු.5,281,596 ක් අවුරුදු 05 ක් ඉක්මවූ පැරණි ණය ශේෂ වූ අතර ඉහත ණය ශේෂයන් අයකරගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) ලංකා පොහොර සමාගමෙන් 2007/2008 වර්ෂයේ සිට හා 2010/2011 වර්ෂය දක්වා අයවිය යුතු එකතුව රු.8,042,989 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම අයකරගෙන නොතිබුණි.

(ඇ) ණයගැතියන් සඳහා රු.25,761,062 ක හානිකරණය සඳහා වෙන් කිරීමක් සිදු කර තිබුණද ඒ වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඈ) පොහොර සහනාධාර වැඩසටහන ආරම්භ කිරීමට පෙර සිට පැවත එන එකතුව රු. 36,171,884 ක් වූ ණය ශේෂ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2002 මැයි 24 දිනැති අංක PF/PE/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 ඡේදය | ප්‍රසාද දීමනා ගෙවීම සඳහා වාර්ෂික ගිණුම් නියමිත දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබිය යුතු බව දක්වා තිබුණද ඊට පටහැනිව 2013/2014 වර්ෂයේ ගිණුම් මාස 03 ක ප්‍රමාද කාලයක් සහිතව 2014 අගෝස්තු 04 දින ඉදිරිපත් කර තිබුණද එක් සේවකයෙකුට රු.13,500 ක් බැගින් ප්‍රසාද දීමනා ලෙස රු.1,219,500 ක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය (i) 5.4.8 (අ) ඡේදය | සැපයුම්කරුවන් විසින් ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 5 කට නොඅඩු මුදලක් කාර්යසාධන සුරක්ෂණයක් ලෙස ඉදිරිපත් කළයුතු වුවත් ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්යසාධන සුරක්ෂණ ඉදිරිපත් නොකළ අවස්ථා 03 ක් නිරීක්ෂණය විය. |
| (ii) 5.4.8 (ආ) ඡේදය | කාර්යසාධන සුරක්ෂණ ඉදිරිපත් කර තිබුණු කොන්ත්‍රාත්කරුවන්ගේ සුරක්ෂණවල වලංගු කාලය වැඩ නිමවීමට අපේක්ෂිත දිනෙන් පසුව දින 28 ක් දක්වා වලංගු විය යුතු බව දක්වා තිබුණද එසේ වැඩ නිමවීමෙන් පසුව දින 28 ක කාලයක් සඳහා වලංගු කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන නොමැති අවස්ථා 14 ක් නිරීක්ෂණය විය. |

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි මාසයේදී පවත්වන ලද ගොවි සමුළුවකට ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් ගෙවීම් කිරීමට 2014 දෙසැම්බර් 22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී භාණ්ඩාගාර අනුමැතිය මත ගෙවීම් කළ යුතු බවට නිර්දේශ කර තිබියදී එම අනුමැතිය ලබාගැනීමකින් තොරව 2014 දෙසැම්බර් 29 දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට රු. 1,080,000 ක් ගෙවා තිබුණි.

(ආ) ජාතික පොහොර ලේකම් කාර්යාලයෙන් අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2013 /2014 වර්ෂයේදී කුඹුරු පොහොර මෙට්‍රික් ටොන් 4,771.04 ක් අනෙකුත් වගාවන් සඳහා වූ පොහොර ලෙස අලෙවි කර තිබූ අතර 2014/2015 වර්ෂයේදී ආනයනය කරන ලද අනෙකුත් වගාවන් සඳහා පොහොර මෙට්‍රික් ටොන් 4,771.04 ක් කුඹුරු පොහොරවලට මාරුකර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මෙහෙයුම්වල මූල්‍ය ප්‍රතිඵලය රු.436,529,170 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.208,984,673 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.227,544,497 ක වර්ධනයක් නිරීක්ෂණය විය. විකුණුම් සහ සහනාධාර රු.162,951,183 කින් වැඩිවීම හා අනෙකුත් ආදායම් රු.74,184,116 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල සැසඳීමේදී පහත සඳහන් විචලනයන් නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ කුඹුරු පොහොර අලෙවිය සියයට 8 කින් සහ අනෙකුත් භෝග සඳහා පොහොර අලෙවිය සියයට 106 කින් වැඩිවී තිබූ බැවින් සමස්ත විකුණුම් සියයට 50 කින් වැඩිවී තිබුණි.

(ආ) මෙට්‍රික් ටොන් එකකට ලාභාන්තිකය කුඹුරු පොහොර සඳහා රු.350 ක්ද අනෙකුත් භෝග සඳහා රු.4,000 ක්ද වන බැවින් අනෙකුත් වගාවන් සඳහා වු පොහොර අලෙවිය සියයට 116 කින් වැඩිවී තිබීම හේතුවෙන් දළ ලාභය සියයට 374 කින් වැඩිවී තිබුණි.

(ඇ) භාණ්ඩාගාරය විසින් නියමිත දිනට පොහොර සහනාධාර නොගෙවීම හේතුවෙන් විනිමය බිල්පත් පියවීම සඳහා සමාගම විසින් රු.6,715,562,085 ක කෙටිකාලීන ණය ලබා ගෙන තිබූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 156 කින් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

2014 දෙසැම්බර් 03 දින සපුගස්කන්ද පොහොර ගබඩාවෙන් නිකුත් කිරීමේ නිවේදන අංක 56690 යටතේ යූරියා පොහොර මෙට්‍රික් ටොන් 17.5 ක් අක්කරෙයිපත්තු ගබඩාවට යවා තිබුණු අතර එම පොහොර තොගය 2015 පෙබරවාරි 11 දින ගබඩාවට භාරදී එය භාරගත් බවට අංක 56521 දරන භාණ්ඩ ලැබීම් තුණ්ඩුව නිකුත් කර තිබුණි. ප්‍රාදේශීය ගබඩාවට යවන ලද පොහොර තොගයේ මළුවල සඳහන් ගිවිසුම් අංකය 2014/CCF/UR/02 වුවත් ගබඩාව භාරගත් තොගයේ මළුවල සඳහන් ගිවිසුම් අංකය 2014/CCF/UR/07 වුයෙන් පොහොර මළුවල සඳහන් ගිවිසුම් අංක එකිනෙකට වෙනස් වීම විගණනයේදී ගැටළු සහගත විය.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනෙකුත් භෝග සඳහා වු පොහොර සහනාධාර වැඩසටහන යටතේ 2011 අගෝස්තු 05 දින කන්තලේ ප්‍රාදේශීය ගබඩාවට ලැබී තිබු පොහොර මෙට්‍රික් ටොන් 16.69 ක් 2015 ජනවාරි 05 දින වන විටත් අලෙවි කර නොතිබුණි.

(ආ) නුවර ප්‍රාදේශීය ගබඩාවට 2014 ජනවාරි 27 දින ලැබී තිබු අනෙකුත් භෝග සඳහා පොහොර මෙට්‍රික් ටොන් 7.8 ක් සෙමින් චලනය වන පොහොර තොග බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 10 ක් සඳහා පොහොර ප්‍රවාහන කටයුතු භාරගත් කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකු විසින් දිගින් දිගටම නියමිත ප්‍රමාණයට ලොරි රථ සැපයීමට අපොහොසත් වු අවස්ථා 10 ක් විගණනයේ දී නිරීක්ෂණය වු අතර ප්‍රවාහන ගිවිසුමේ 03 ඡේදය අනුව දිනකට රු.1,500 බැගින් දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුණුවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු.575,000 ක් ප්‍රදාන ලෙස සුබසාධන ආයතන වෙත ලබා දී තිබුණි.

(ආ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී සමාගමේ කාර්ය මණ්ඩලයට දිරි දීමනා වශයෙන් රු.11,008,504 ක් ගෙවා තිබුණු අතර සමාගමේ සේවකයෙකු නොවන සභාපතිවරයාට ගෙවන ලද රු.180,000 ක දිරි දීමනාවක් ද එහි ඇතුලත් වී තිබුණි.

## 4.4 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොහොර ප්‍රවාහනයේදී හා ප්‍රමිතියෙන් තොර ඇසුරුම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.11,450,095 ක තොග හානි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය ගබඩා දෙකක සිදුකල භෞතික තොග සත්‍යාපනයේදී පිරිවැය රු.5,019,471 ක් වූ මෙට්‍රික් ටොන් 90.75 ක තොග ඌනතාවයක් වාර්තා වී තිබුණත් ඒවා වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අනුරාධපුර හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි පොහොර ප්‍රවාහනය සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් ප්‍රමාණවත් ලොරිරථ නොසැපයීම නිසා බාහිර ලොරිරථ යොදාගෙන පොහොර ප්‍රවාහනය කිරීම වෙනුවෙන් අමතර ප්‍රවාහන ගාස්තු ලෙස රු.2,725,513 ක් ගෙවා තිබුණි.

## 4.5 ආර්ථික නොවූ ගණුදෙනු

2014 මැයි 12 සිට බදු කුලී පදනම මත ලබාගෙන තිබූ සපුගස්කන්ද පොහොර ගබඩාවෙහි තොග 2014 දෙසැම්බර් 03 දින වන විට අවසන් වී තිබුණද ගබඩාව ආපසු භාරදීමට කටයුතු නොකර 2015 පෙබරවාරි 11 දින දක්වාම මාස 2 ක් සඳහා හිස් ගබඩාව වෙනුවෙන් රු.1,774,271 ක බදු කුලී ගෙවා තිබුණි.

## 4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 සැප්තැම්බර් සිට 2014 අගෝස්තු දක්වා සමාගමේ කම්කරු සේවාවන් පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවමින් 2013 ජූලි මාසයේදී රු.23,184 ක් වැය කර පුවත්පත් දැන්වීමක් පලකර තිබුණු අතර සාධාරණ හේතු දැක්වීමකින් තොරව ඊට පසුදිනම රු.10,080 ක් වැය කර එම දැන්වීම අවලංගු කිරීම සඳහා එම පුවත්පතේම නැවත දැන්වීමක් පළ කර 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛන්ඩව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට කම්කරු කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ වාහන නැවතුම් අංගනයක් ඉදිකිරීමේ ප්‍රසම්පාදනය

(i) යථෝක්ත ඉදිකිරීම සඳහා සවිස්තරාත්මක ඇස්තමේන්තු, ප්‍රමාණ පත්‍ර හා සැලසුම් පිළියෙල කිරීම සඳහා සුදුසුකම් ලැබූ පුද්ගලයෙකුගේ සහාය ලබාගෙන නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදයට පටහැනිව ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 08 ක කාලයක් පමණක් ලබාදී තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ප්‍රකාරව වැඩ අවසන් කිරීම පිළිබඳ ඉංජිනේරුවරයෙකුගේ/ උපදේශකවරයෙකුගේ සහතික කිරීමකින් තොරව රු.669,773 ක් ගෙවා තිබුණි.

(iii) එසේම ඇස්තමේන්තු හා සැලසුම් පිළියෙල කළ නිලධාරියා තාක්ෂණික ඇගැයීම් කමිටුවේ සාමාජිකයකු ලෙසද සහාභාගි වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------

### 5.1 නොවිසඳී ඇති විගණන ඡේද

----------------------------

2012 ජූලි 05 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී සමාගම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත දිරිදීමනා පරිපාටියක් පිළියෙල කර ගැනීමේ අවශ්‍යතාවය දක්වා තිබුණද 2014 ඔක්තෝබර් 31 දින වන විට පිළියෙල කර තිබුණු පරිපාටිය සඳහා 2015 අගෝස්තු 20 දින දක්වාම මහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම.
(ආ) ගබඩා පාලනය
(ඇ) පොහොර බෙදාහැරීමේ ක්‍රියාවලිය
(ඇ) වාහන පාලනය